// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1890/35 - 2014 නොවැම්බර් මස 28 වැනි සිකුරාදා - 2014.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (අ) වැනි කොටස - පළාත් සභා

පළාත් සභා නිවේදන

සබරගමුව පළාතේ පළාත් සභාව

සබරගමුව පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය

සබරගමුව පළාතේ පළාත් සභාවේ 2014 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 24 වන වගන්තිය යටතේ එකී පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන, සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, මඟී ප්‍රවාහන, සහ වතු සුභසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍යවරයා වන මා විසින් සාදන ලද නියෝග.

මහීපාල හේරත්,
සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍ය නීතිය හා සාමය, මුදල් හා සැළසුම්, පළාත් පාලන,
සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, වනිතා කටයුතු, සමුපකාර, වෙළඳ හා ආහාර, මඟී ප්‍රවාහන,
සහ වතු සුභසාධන, පරිසර, ප්‍රවෘත්ති සහ නිවාස හා ඉදිකිරීම් කටයුතු අමාත්‍ය.

2014 නොවැම්බර් මස 11 වැනි දින,
සබරගමුව පළාතේ පළාත් සභාවේ දී ය.

නියෝග

ලුහුඬු නාමය

1. මෙම නියෝග සබරගමුව පළාත් සභාවේ 2014 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යනුවෙන් හැඳින්වේ.

දායකයෙකු වීමට සුදුසුකම්

2. I. 1992 අංක 11 දරන හා 1983 අංක 32 දරන සංශෝධිත පනත් වලින් සංශෝධිත 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත යටතේ සහ සංශෝධන සමග කියවෙන 1994 අංක 03 දරන සබරගමුව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සහ 2007 අංක 03 දරන සබරගමුව පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ සබරගමුව පළාතේ ලියාපදිංචි සමුපකාර සමිතියක හෝ සංගමයක සේවයේ නියතු මෙහි මින් මතු සේවකයා නමින් හඳුන්වනු ලබන 1992 අංක 51 දරන සංශෝධිත පනත සමග කියවෙන, 1972 අංක 12 දරන සමුපකාර සේවක කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව ස්ථිර පත් වීමක් ලද සේවකයෙකු, සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ දායකයෙකු වශයෙන් බඳවා ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

II. ඉහත අංක 2.1 යටතේ කෙසේ සඳහන් වුවද සබරගමුව පළාත් සභාවේ 2014 අංක 02 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට එම පළාතේ සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ සේවය නියුතුව සිටි, ඉහත 2.1 වගන්තියේ කොන්දේසි පරිදි ස්ථිර පත්වීමක් නොලද සේවකයින් ඔවුන්ට පෞද්ගලික වන ස්ථිර කිරීම සඳහා සබරගමුව පළාතේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලබා තිබේ නම් ඔවුන්ට පෞද්ගලික වන සේ හා අනුමත පිරිස්බල තක්සේරුව ඉක්මවා සේවකයන් සේවයේ යොදවා තිබේ නම් අධිසේවක පදනම යටතේ සේවයේ ස්ථිර කර ඇති විටක මෙම යෝජනා ක්‍රමය යටතේ හිමිකම් ලැබීමට සුදුස්සන් වන්නේ ය.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

III. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට පසුව බඳවා ගන්නා සේවකයින් අනුමත පිරිස්බල තක්සේරුව තුළ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් අනුමත කළ සේවකයින් පමණක් විය යුතු ය.

3. I. (අ) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වන දිනට සේවයේ නියුතුව සිටි, යෝජනා ක්‍රමයට බඳවා ගනු ලැබීමට හිමිකම් ලැබූ තැනැත්තෙකු තමා දායකයෙකු ලෙස විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීම සඳහා මනාපය පළ කළ යුතු ය.

මනාපය පළ කිරීම සහ අනුමත කිරීම

(ආ) මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට බැඳීමට අපේක්ෂා කරන සේවකයෙකු විසින්, මෙහි මින් මතු අධ්‍යක්ෂකවරයා යයි හඳුන්වනු ලබන යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂකවරයා විසින් භාවිතා කිරීමට නියමකර ඇති ඉල්ලුම් පත්‍ර පුරවා තත්කාලයේ බලය පවරා ඇති නිලධාරියා වෙත අධ්‍යක්ෂකවරයා විසින් නියම කරන ලද කාලසීමාවක් තුළ ඉදිරිපත් කළ යුතු ය.

(ඇ) ඉහත 3.1 (ආ) හි සඳහන් කාල සීමාව මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට මාස 06 ක කාලයක් නො ඉක්මවන කාලයක් විය යුතු ය.

II. මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක වූ දිනෙන් පසුව හා මෙම නියෝග ක්‍රියාත්මක වීමට පෙර ස්ථිර සේවයට බැඳෙන හා බැඳුන සේවකයින් අධ්‍යක්ෂකවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා අධ්‍යක්ෂකවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියා වෙත මෙම නියෝග ක්‍රියාත්මක වන දින සිට දින 90 ක් හෝ තමන් සේවයට බැඳුන දින සිට දින 90 ක් හෝ යන දෙකෙන් පසුව එළඹෙන දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය.

දායකයකුලෙස සැළකීම

III. මෙම නියෝග ක්‍රියාත්මක වූ දින සිට ස්ථිර සේවයට බැඳුණු සේවකයෙකු තමා සේවයට බැඳුණු දින සිට දින 90 ක කාලයක් තුළදී අධ්‍යක්ෂකවරයා විසින් භාවිතය සඳහා නියම කර ඇති ඉල්ලුම් පත්‍රය පුරවා තත්කාර්යය සඳහා අධ්‍යක්ෂකවරයා විසින් බලය පවරනු ලැබූ නිලධාරියාවෙත ඉදිරිපත් කළ යුතු ය.

4. I. බඳවා ගැනීම් සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුනු විට ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සපයන ලද තොරතුරු වල සත්‍යතාවය හා නිවැරදි භාවය බලය පැවරූ නිලධාරියා විසින් තහවුරු කර ගත යුතු අතර ඉල්ලුම් පත්‍රය ලැබී දින 30 ක් ඇතුලත තම නිර්දේශය සමග අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

II. අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් පත්‍රය අනුමත කළ විට එම ඉල්ලුම්කරු යෝජනා ක්‍රමයේ දායකයෙකු ලෙස සැලකේ.

අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීම

III. පහත දැක්වෙන එක් කරුණක් හෝ කරුණු කිහිපයක් මත යම් ඉල්ලුම් කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කළ හැකිය.

(අ) මෙම නියෝග මාලාවේ 2.1 හා 2.11 සඳහන් ආකාරයට සේවකයෙකු නොවූ විට,

(ආ) වයස අවු. 18 ට අඩු හෝ වයස අවු. 60 ඉක්මවූ සේවකයෙකු වූ විට,

(ඇ) ඉල්ලුම් පත්‍රය අසම්පූර්ණ වූ විටක,

(ඈ) අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති විටක,

(ඉ) ඉල්ලුම් පත්‍ර මෙම නියෝග මාලාවේ නියම කර ඇති කාල සීමාව තුළ ඉදිරිපත් කර නොතිබූ විටක,

IV. යම් ඉල්ලුම් පත්‍රයක් අධ්‍යක්ෂකවරයා විසින් ප්‍රතික්ෂේප කිරීම, යෝජනා ක්‍රමයේ උපදේශක කමිටුවේ එකඟතාවය මත ක්‍රියාත්මක කළ යුතුය. එසේ ඉල්ලුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරනු ලැබූ අවස්ථාවක, උපදේශක කමිටුවේ එකඟතාවය ලැබූ දින සිට දින 30 ක් ඇතුළත ඉල්ලුම්කරු වෙත අධ්‍යක්ෂකවරයා විසින් දැනුම් දෙනු ලැබිය යුතුය.

දායක මුදල

5. I. යෝජනා ක්‍රමයට බැඳෙන දායකයෙකු ආරම්භක ගාස්තු රු.5000/- ක් සහ තම මසක ඒකාබද්ධ වැටුපෙන් සියයට පහක් (5%) ක් මාසික දායකය වශයෙන් අධ්‍යක්ෂකවරයා වෙත ගෙවිය යුතු වන අතර, එම මාසික දායක මුදල තම මාසික වැටුපෙන් අය කර අධ්‍යක්ෂකවරයා වෙත යැවීම සඳහා සේවා යෝජක සමිතියට හෝ සංගමයට ලිඛිතව බලය පැවරිය යුතු ය.

II. සේවා යෝජක සමිතිය හෝ සංගමය විසින් හෝ සේවා දායකයා විසින් යෝජනා ක්‍රමයට බැඳෙන එක් දායකයෙකු වෙනුවෙන් රුපියල් පන්දහසක් (රු.5000) සහ දායකයා යෝජනා ක්‍රමයට බැඳුන දින සිට අධ්‍යක්ෂකවරයා විසින් නියම කරනු ලබන කාල සීමාවක් ඇතුළත එකවර හෝ වාරික කිහිපයකින් අධ්‍යක්ෂකවරයා විසින් නියම කරනු ලබන පරිදි මාස 06 ක් ඇතුළත ගෙවිය යුතු අතර සේවා යෝජක සමිතිය හෝ සංගමය විසින් එක් එක් දායකයෙකු වෙනුවෙන් ඔහුගේ / ඇයගේ මාසික වැටුපෙන් 2.5% කට සමාන මුදලක් මාසිකව අරමුදල වෙත ගෙවිය යුතුය. සමිති දායකය

III. සේවා යෝජක සමිතිය හෝ සංගමය හෝ විසින්, එක් එක් සේවකයාගේ මාසික වැටුපෙන් අඩුකර අයකර ගන්නා ලද මාසික දායක මුදල් හා සමිතියේ / සංගමයේ දායක මුදල් ඊළඟ මස අවසන් දිනට හෝ ඊට පෙර අධ්‍යක්ෂවරයා වෙත ලැබෙන සේ යවනු ලැබිය යුතු ය. දායක මුදල් ප්‍රේෂණය

IV. ඉහත 5.III හි නියම කර ඇති නියමිත දිනට දායක මුදල් අධ්‍යක්ෂවරයා වෙත යැවීම පැහැර හැර ඇති විටෙක අදාල සමුපකාර සමිතිය හෝ සංගමය හෝ පහත සඳහන් පරිදි දඩ මුදලකට යටත් විය යුතු ය. එම දඩ මුදල අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද දිනට ගෙවා නිම කළ යුතු ය. දඩ මුදල් අය කිරීම

* ප්‍රමාදය දින 10 නොඉක්මවූ විට	05%
* ප්‍රමාදය දින 11 ත් මාස 01 ත් අතර වූ විට	10%
* ප්‍රමාදය මාස 01 ත් 03 ත් අතර වූ විට	15%
* ප්‍රමාදය මාස 03 ත් 06 ත් අතර වූ විට	20%
* ප්‍රමාදය මාස 06ත් 12 ත් අතර වූ විට	30%
* ප්‍රමාදය මාස 12 ට වැඩි වූ විට	50%

6. මෙම යෝජනා ක්‍රමයේ දායකයෙකු විශ්‍රාම වැටුප් හිමිකම් ලැබීම සඳහා අවම වශයෙන් මාස 60 ක දායක මුදල් අනිවාර්යයෙන්ම අධ්‍යක්ෂකවරයා වෙත ගෙවා සම්පූර්ණ කර තිබිය යුතු ය. අවම දායක මුදල හා විශ්‍රාම වැටුප් හිමිකම්

I. (අ) විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනට වයස අවු. 55 ඉක්ම වූ දායකයෙකු සම්බන්ධයෙන් වූ විට දී වාරික 60 කින් සිය අවම දායක මුදල් ගෙවීමට නොහැකි වන අවස්ථාවක දී ඉතිරි හිඟවාරික ප්‍රමාණය එකවර හෝ කොටස් වශයෙන් දායකයා විසින් අවසන් වරට ලැබූ වැටුප් පදනම් කරගෙන වයස අවු. 60 වන විට අධ්‍යක්ෂකවරයා වෙත අදාළ දායක මුදල් ගෙවා නිම කළ යුතු ය.

(ආ) එසේ වුවද යම් හෙයකින් වයස අවු. 60 වන විට අවම දායක මුදල වන මාසික වාරික 60 ක මුදල, ගෙවා නිම කිරීමට යම් දායකයකුට නොහැකියාක් ඇත්නම්, විශ්‍රාම යාමෙන් එක් අවුරුදු උපරිම කාල සීමාවක් ඇතුළත එකී දායක මුදල් ගෙවා නිම කිරීමට එකී දායක හිමියාට හිමිකම් ඇත.

(ඇ) ඉහත 6.I (අ) හා 6.I (ආ) යටතේ දායක මුදල් ගෙවා නිම කරන දායකයෙකුට, විශ්‍රාම වැටුප සඳහා හිමිකම් ලැබෙන්නේ මෙම නියෝග වල (අ) උප ලේඛණයේ වගු අංක 02 සඳහන් ආකාරයටය.

II. (අ) විශ්‍රාම වැටුප් ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දිනට සේවය කරමින් සිට, මෙම නියෝග ක්‍රියාත්මක වන දිනට සේවයෙන් විශ්‍රාම ලබා ඇති මෙම යෝජනා ක්‍රමයේ දායකත්වය ලැබූ දායකයෙකු, සිය අවම දායක මුදල් වාරික 60 ක එක් වර හෝ කොටස් වශයෙන් එම තැනැත්තා විසින් අවසන් වරට ලැබූ වැටුප පදනම් කරගෙන එක් අවුරුදු කාල සීමාවක් තුළ ගෙවා නිම කළ යුතු ය.

(ආ) ඉහත 6.II (අ) යටතේ දායක මුදල් ගෙවා නිම කරන දායකයෙකුට, විශ්‍රාම වැටුප සඳහා හිමිකම් ලැබෙන්නේ මෙම නියෝගවල (අ) උප ලේඛණයේ වගු අංක 02 හි සඳහන් වන ආකාරයටය.

(ඇ) මෙම යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ උපන් දිනයට අවුරුදු 55 ට නොවැඩි දායකයෙකු සම්බන්ධයෙන් වූ විට දී, මෙම නියෝග වල (අ) උප ලේඛණයේ වගු අංක 01 හි සඳහන් ආකාරයට අවම මාසික දායක මුදල් ගෙවිය යුතු අතර, එම වගුවේ IV වැනි තීරයේ සඳහන් ආකාරයට විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

7. වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ලබා ඇති දායකයෙකු සම්බන්ධයෙන් වූ විට -

වෛද්‍ය හේතුන් මත ප්‍රතිලාභ

I. ඔහු විශ්‍රාම ලැබූ දිනට වයස අවුරුදු 50 ඉක්ම වූ දායකයෙකු, අවම වශයෙන් දායක මුදල් වාරික 60 ක් ගෙවා ඇති විට, වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත.

II. විශ්‍රාම ලැබූ දිනට වයස අවුරුදු 50 නොඉක්ම වූ දායකයෙකු අවම වශයෙන් දායක මුදල් වාරික 120ක් ගෙවා ඇති විටෙක වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේය.

III. එසේ වුව ද දායකයා ඉල්ලා සිටින්නේ නම්, එතෙක් අය වූ දායක මුදල් හා ඊට අදාළ පොළිය උපදේශක කමිටුවේ අනුමැතිය මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට දායකයෙකුට හිමිකම් ඇත්තේ ය.

IV. දායකයෙකුට හිමිකම් ඇත්තේ ඉහත 7.I හෝ 7.II යටතේ විශ්‍රාම වැටුපක් හෝ 7.111 යටතේ ගොනු මුදලක් හෝ දෙකෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා ගැනීමටය.

V. වයස අවුරුදු 50 ඉක්ම වූ සේවකයෙක් සම්බන්ධයෙන් වූ විටෙක අවම දායක මුදල් වාරික 60ක් වත් නොගෙවා ඇති විටෙක අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද කාලයක් තුළදී හිඟ දායක වාරික මුදල් එකවර හෝ වාර කිහිපයකින් හෝ ගෙවා නිම කරන ලද දායකයෙකුට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විටෙක විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය. හිඟ වාර මුදල් ගෙවීම සඳහා නියම කරන ලද කාලය දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේ හෝ ගෙවීම නියම කරනු ලබන දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් යන දෙකෙන් පළමුව එළඹෙන දිනය විය යුතු ය.

VI. වයස අවුරුදු 50 ට වඩා අඩුවෙන සේවකයෙකු සම්බන්ධයෙන් වූ විටෙක, අවම දායක වාරික මුදල් වාරික 120 නොගෙවා ඇති විටෙක දායකයාගෙන් එතෙක් අය වූ දායක මුදල් හා ඊට අයත් පොළිය උපදේශක කමිටුවේ එකඟත්වය මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත්තේය.

VII. ඉහත 7.V යටතේ හිමිකම් නොපාන්නේ නම් එවැනි දායකයකු සඳහා උපදේශක කමිටුවේ එකඟත්වය ඇතිව ශුද්ධ දායක මුදල හා අදාල පොළී මුදල් එකවර ගෙවනු ලබන ගොණු මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත.

සේවයෙන් ඉල්ලා අස්වූ විට ගෙවනු ලබන ප්‍රතිලාභ

8. I. දායකයෙකු විශ්‍රාම වැටුප හිමි වීමට පෙරාතුව සමුපකාර සේවයෙන් ඉල්ලා අස්වන්නේ නම් ඔහු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැළකිය යුතු අතර එවැනි අයෙකුට අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කමිටුවේ එකඟත්වය මත තීරණය කරණු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාළ වෙන පොළිය එකවර ගෙවන ගොනු මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය හැකිය.

වැටුප් රහිත නිවාඩු ලබා ඇති විට

II. යම් දායකයකු විධිමත්ම විදේශ රැකියාවක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා තාවකාලිකව සමුපකාර සේවයෙන් ඉවත්ව සිටි අවස්ථාවකදී එම වැටුප් රහිත සේවා කාලය විශ්‍රාම වැටුප් ගණනය කිරීම සඳහා ගණන් නොගත යුතු අතර එම කාලය සඳහා දායක මුදල් ද අය නොකල යුතු ය.

අවලංගු කල සමිතියක හෝ සංගමයක හෝ දායකයකුට ප්‍රතිලාභ

9. යම් සමුපකාර සමිතියක් හෝ සංගමයක් හෝ නීතිය අනුව ඇවර කිරීම සඳහා ලියාපදිංචිය අවලංගු කර ඇති විටක, සමිතිය හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන දිනය දක්වා දායක මුදල් ගෙවා ඇති විටක,

I. සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන ලද දිනට වයස අවුරුදු 50 ඉක්ම වූ දායකයකු අවම වශයෙන් දායක මුදල් වාරික 60 ක් ගෙවා ඇති විටෙක වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත.

II. සමිතියේ හෝ සංගමයේ ලියාපදිංචිය අවලංගු කරන ලද දිනට වයස අවුරුදු 50 නොඉක්ම වූ දායකයකු අවම වශයෙන් දායක මුදල් වාරික 120 ක් ගෙවා ඇති විටෙක වයස අවුරුදු 60 සම්පූර්ණ වූ පසු විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේ ය.

III. එසේ වුවද දායකයා ඉල්ලා සිටින්නේ නම් එතෙක් අයවූ දායක මුදල් හා ඊට අදාල පොළිය උපදේශක කමිටුවේ අනුමැතිය මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට දායකයකුට හිමිකම් ඇත්තේ ය.

IV. දායකයකුට හිමිකම් ඇත්තේ ඉහත 9.I හෝ 9.II යටතේ විශ්‍රාම වැටුපක් හෝ 9.III යටතේ ගොනු මුදලක් හෝ යන දෙකෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා ගැනීමටය.

V. වයස අවුරුදු 50 ඉක්මවූ සේවකයෙක් සම්බන්ධයෙන් වූ විටෙක, අවම දායක මුදල් වාරික 60 ක් වත් නොගෙවා ඇති විටෙක, අධ්‍යක්ෂවරයා විසින් නියම කරන ලද කාලයක් තුළ හිඟ දායක වාරික මුදල් එකවර හෝ වාර කිහිපයකින් හෝ ගෙවා නිම කරන ලද දායකයකුට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ විටක විශ්‍රාම වැටුප් ලැබීමට හිමිකම් ඇත්තේය. හිඟවාර මුදල් ගෙවීම සඳහා නියම කරන ලද කාලය දායකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනයේ හෝ ගෙවීම නියම කරනු ලබන දිනයේ සිට එක් අවුරුදු කාල සීමාවක් යන දෙකෙන් පළමුව එළඹෙන දිනය විය යුතු ය.

VI. වයස අවුරුදු 50ට වඩා අඩුවන සේවකයකු සම්බන්ධයෙන් වූ විටෙක, අවම දායක වාරික මුදල් 120 ක් නොගෙවා ඇති විටෙක දායකයාගෙන් එතෙක් අයවූ දායක මුදල් සහ ඊට අයත් පොළිය උපදේශක කමිටුවේ එකඟත්වය මත එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලැබීමට එවැනි දායකයකුට හිමිකම් ඇත්තේ ය.

VII. ඉහත 9.V යටතේ හිමිකම් නොපාන්නේ නම්, එවැනි දායකයකු සඳහා උපදේශක කමිටුවේ එකඟත්වය ඇතිව ශුද්ධ දායක මුදල හා අදාළ පොළි මුදල් එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ලබා ගැනීමට හිමිකම් ඇත.

10. දායකයකු යෝජනා ක්‍රමය ට යම් අතිරේක දායක මුදලක් නොගෙවා අවස්ථාවෝචිත පරිද මරණ පාරිතෝෂිකයකට හිමිකම් ලැබිය යුතු ය. *මරණ පාරිතෝෂිකය*

11. මෙහි (ආ) උපලේඛණයේ I වැනි තීරයේ සඳහන් සේවා කාලයක් ඇති දායකයකු වූ විට II තීරයේ සඳහන් මරණ පාරිතෝෂිකය ලැබීමට මතු නියම කර ඇති පරිදි දායකයාගේ යැපෙන්නන්ට හිමිකම් ලැබිය යුතු ය. *මරණ පාරිතෝෂිකය ලැබීමට හිමිකම්*

I. මිය ගිය දායකයා විවාහකයකු වන විටදි -

(අ) වැන්දඹු භාර්යාව / වැන්දඹු පුරුෂයා වෙත මරණ පාරිතෝෂිකයෙන් හරි අඩක් ද, රැකියා විරහිත අවිවාහක දරුවන් අතර සමසේ ඉතිරි හරි අඩද ගෙවිය යුතු ය.

(ආ) රැකියා විරහිත අවිවාහක දරුවන් නොමැති විටකදී මුළු මරණ පාරිතෝෂික මුදල වැන්දඹු භාර්යාව/වැන්දඹු පුරුෂයා වෙත ලැබීමට හිමිකම් ඇත්තේ ය.

(ඇ) දායකයාගේ වැන්දඹු භාර්යාව/වැන්දඹු පුරුෂයා ජීවත්ව නොසිටි විටෙක, මුළු මරණ පාරිතෝෂික මුදල අවිවාහක දරුවන් අතර සමසේ බෙදිය යුතු ය.

II. මියගිය දායකයා අවිවාහකයෙකු වන විටදී -

(අ) දායකයාගේ මව හා පියා අතර එකී මරණ පාරිතෝෂික මුළු මුදල සමව බෙදිය යුතුය. මව හා පියා යන දෙදෙනාගෙන් එක් අයකු පමණක් ජීවත්ව සිටී නම් එම අය වෙත මුළු පාරිතෝෂික මුදල ලබාදිය යුතු ය.

(ආ) මව හා පියා දෙදෙනාම ජීවත් නොසිටි විටදී අවිවාහක රැකියා විරහිත සොයුරු සොයුරියන් අතර එකී මුදල සමසේ බෙදිය යුතු ය.

III. මියගිය දායකයාගේ මරණ පාරිතෝෂිකය බාල වයස්කරුවන්ට හිමිවන අවස්ථා වලදී ඔවුන් නමින් ග්‍රාමීය බැංකුවේ බාලවයස් ගිණුමක තැන්පත් කර ඒ බව අදාල භාරකරුවන් වෙත දැනුම් දිය යුතු අතර ඒවා ලේඛන ගතකර ගිණුම් පොත් / සහතික ආරක්ෂිතව තබාගත යුතුය. බාලවයස්කරුවන්ගේ වයස සම්පූර්ණ වී ඉල්ලුම් කල විටක ඒවා නිදහස්කර දීමට කටයුතු කල යුතු ය.

IV. යැපෙන්නන් සම්බන්ධයෙන් නිරාකරණය කරගත නොහැකි ගැටළු පැන නගින සෑම අවස්ථාවකදීම අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කමිටුවේ එකඟත්වය මත තීරණය කරනු ලබන යැපෙන්නන්ට ගෙවීම් කළ යුතු ය.

12. දායකයාගේ යැපෙන්නන් විසින් දායකයාගේ මරණය සඳහා වූ පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබන විටදී එම මරණය සිදු වී දින 90ක් තුලදී අධ්‍යක්ෂකවරයා වෙත වාර්තා කරනු ලැබිය යුතුය. *දින 90 ක් ඇතුලත මරණය දැනුම් දිය යුතු බව*

13. දායකයා මරණයට පත්වූ විටෙක අධ්‍යක්ෂකවරයා විසින් උපදේශක කමිටුවේ තීරණය මත එම දායකයාගේ ශුද්ධ දායක මුදල හා අදාල පොළිය ද ගොනු මුදලක් ලෙස II නියෝගයේ සඳහන් ආකාරයට දායකයාගේ යැපෙන්නන්ට ගෙවනු ලැබිය යුතු ය. *මියගිය දායකයාගේ දායක මුදල්*

සහතිකය නැවත වලංගු කරවා ගැනීම සඳහා දින 30 ක් ඇතුලත අභියාචනා කළයුතු බව

14. ප්‍රඥප්තියේ 14.II යටතේ යම් කිසි දායකයෙකුට ප්‍රතිලාභ අහිමි වන්නේ නම්, ඒ බව දායකයා වෙත අධ්‍යක්ෂවරයා දැනුවත් කල දින සිට, තම සහතිකය වලංගු කරවා ගැනීම සඳහා දින 30 ක් ඇතුළත අධ්‍යක්ෂවරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

සේවයෙන් පහ කරනු ලැබූ හෝ සේවය අතහැර ගිය දායකයකු සම්බන්ධයෙන් වූ විට

15. I. යම්කිසි දායකයකු සමුපකාර සේවයෙන් පහ කරනු ලැබූවහොත් හෝ තනතුර අතහැර ගිය අයකුගේ සලකනු ලැබූවහොත් හෝ ඔහු යෝජනා ක්‍රමයෙන් ඉවත්වූ ලෙස සැලකිය යුතු අතර, එවැනි අයකු අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කමිටුවේ එකඟත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල පමණක් ලැබීමට එම දායකයාට හිමිකම් ලැබිය හැකිය.

නීත්‍යානුකූල පරීක්ෂණයකින් වරදකරු වූ දායකයකු සම්බන්ධයෙන් වූ විට විටක හෝ

II. එසේ වුවද සමිතියට හෝ සංගමයට හෝ අලාභයක් සිදුකර ඇති බවට නීත්‍යානුකූල පරීක්ෂණයකින් සනාථ වී ඇති විටක හෝ එවැනි නිත්‍යානුකූල පරීක්ෂණයක් පවත්වමින් සිටින අවස්ථාවකදී හෝ ඉහත කී ශුද්ධ දායක මුදල ඔහුට ගෙවිය යුත්තේ සමිතියේ අලාභය සම්පූර්ණයෙන්ම ප්‍රතිපූර්ණය කර ඇත්නම් හෝ නිත්‍යානුකූල පරීක්ෂණය අවසන් වී සමිතියට අලාභයක් සිදුවී නොමැති බවට සනාථ වුවහොත් පමණි.

නැවත සේවයේ පිහිටුවනු ලැබූ දායකයකු සම්බන්ධයෙන් වූ විට

16. යම්කිසි දායකයකු සමුපකාර සේවයේ වැඩ තහනමකට ලක්ව නැවත සේවයේ පිහිටුවනු ලැබූවහොත්, අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් තුළදී හිඟ දායක මුදල් ගෙවා නිම කළ යුතු ය.

එසේ ගෙවා අවසන් කළ යුතු දිනය දායකයා වෙත දැන්විය යුතු අතර එදිනට පෙර හිඟ දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වුවාසේ සැළකිය යුතු ය.

17. I. ප්‍රඥප්තියේ 13.I වගන්තිය යටතේ යම් දායකයෙකු වෙත නියමිත ප්‍රතිලාභ අහිමි වූ විටෙක ඒ බවට දැන්වීමක් අධ්‍යක්ෂවරයා විසින් එම දායකයා වෙත යැවිය යුතු ය.

II. ඉහත 17.I යටතේ සහතිකය අහිමිවූ යම්කිසි දායකයෙකු ට තවදුරටත් යෝජනා ක්‍රමයේ රැඳී සිටීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, ඔහු විසින් සමිතියට සිදුකර ඇති අලාභය සම්පූර්ණයෙන් ම ගෙවා අවසන් කොට අධ්‍යක්ෂකවරයා වෙත ලිඛිතව ඉල්ලීමක් කළ හැකිය. එසේ කරනු ලබන ඉල්ලීම 17.I වගන්තිය අනුව දැන්වීම ලැබී මාස 03 ක් ඇතුළත අධ්‍යක්ෂකවරයා වෙත එවිය යුතු ය.

III. ඉහත 17.II ඉල්ලීම පරිදි යෝජනා ක්‍රමයේ තවදුරටත් රැඳී සිටීමට ඉඩ ලබා දුන් විටක, අධ්‍යක්ෂකවරයා විසින් නියම කරනු ලබන කාල සීමාවක් තුළදී හිඟ දායක මුදල් ගෙවා නිමකළ යුතුය. එසේ ගෙවා අවසන් කල යුතු දිනය දායකයා වෙත දැන්විය යුතු අතර, එදිනට පෙර හිඟ දායක මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් ඔහුගේ සහතිකය අවලංගු වූවෙ සේ සැලකිය යුතුය. නමුත් අධ්‍යක්ෂකවරයා විසින් නියම කරන කාලය මාස 06ක් නොඉක්මවිය යුතු ය.

වයස අවුරුදු 60 ට පෙර විශ්‍රාම ගත් දායකයකු සම්බන්ධයෙන් වූ විට

18. I. වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් ඉක්බිතිව කිසියම් දායකයකු වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට ප්‍රථමයෙන් විධිමත්ව සේවයෙන් විශ්‍රාම ගන්නා දායකයකුට ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාව වනවිට ගෙවා සම්පූර්ණ කර ඇති දායක මුදල් වාරික සංඛ්‍යාව පදනම් කරගෙන මෙම නියෝග වල (අ) උපලේඛනයේ වගු අංක 01 හි IV වැනි තීරුවේ දැක්වෙන විශ්‍රාම වැටුපක් ලැබීමට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට හිමිකම් ලැබිය යුතු ය.

II. නොඑසේ නම් එවැනි දායකයකු විසින් අධ්‍යක්ෂකවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීම මත අධ්‍යක්ෂකවරයා විසින් උපදේශක කමිටුවේ එකඟත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල ඊට අදාල වන පොලිය එකවර ගෙවන ගොණු මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය යුතු ය.

III. එකී දායකයකුට හිමිකම් ඇත්තේ 18.I යටතේ විශ්‍රාම වැටුපක් හෝ 18.II යටතේ ගොණු මුදලක් යන දෙකෙන් එක් ප්‍රතිලාභයක් පමණක් ලබා ගැනීමටය.

19. මෙම නියෝග මාලාවේ 7, 9 හා 18 යන වගන්ති ප්‍රකාරව විශ්‍රාම වැටුප් හිමිකම් ලබන දායකයකු, වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට මත්තෙන් මියගියහොත්, මෙහි (ආ) උපලේඛනය අනුව ගණනය කරන ලද මරණ පාරිතෝෂිකය හා 13 වන නියෝගයේ සඳහන් වන ගොනු මුදල මෙම නියෝග මාලාවේ II වැනි වගන්තියේ ප්‍රකාරව හිමිකම් ලබන පාර්ශවයන් වෙත ගෙවනු ලැබිය යුතුය.

වයස අවුරුදු 60 ට පෙර සේවයෙන් ඉවත් වී විශ්‍රාම වැටුප් ලැබීමට පෙර මිය ගිය දායකයකු සම්බන්ධයෙන් වූ විට

20. මෙම නියෝග මාලාව යටතේ ගොනු මුදලක් ලැබීමට හිමිකම් ලබන දායකයකු විසින් සමිතියට හෝ සංගමයට හෝ අලාභයක් සිදුකර ඇති බවට නිත්‍යානුකූල පරීක්ෂණයකින් සනාථ වී ඇති විටක හෝ එවැනි නීත්‍යානුකූල පරීක්ෂණයක් පවත්වමින් සිටින අවස්ථාවකදී හෝ එකී ගොනු මුදල ඔහුට ගෙවිය යුත්තේ සමිතියේ අලාභය සම්පූර්ණයෙන්ම ප්‍රතිපූර්නය කර ඇත්නම් හෝ නිත්‍යානුකූල පරීක්ෂණය අවසන්වී සමිතියට අලාභයක් සිදු වී නොමැති බවට සනාථ වුවහොත් පමණි.

සමිතියට අලාභයක් සිදුකර ඇති විටකදී ගොනු මුදල නොගෙවිය යුතු බව

21. යම් විශ්‍රාමිකයකු මියගිය විටෙක ඔහු මිය යන අවස්ථාව දක්වා ලබාගෙන ඇති මුළු විශ්‍රාම වැටුප් මුදල ගෙවන ලද මුළු දායක මුදලට හා ඊට අදාල පොලී ප්‍රමාණයට වඩා අඩුවූ අවස්ථාවකදී, එම අඩුවූ මුදල විශ්‍රාමිකයාගේ යැපෙන්නන් හට එකවර ගෙවනු ලබන ගොනු මුදලක් ලෙස ගෙවිය හැකිය.

22. මෙම නියෝග මාලාව යටතේ ගොනු මුදලක් හෝ ශුද්ධ දායක මුදලක් හෝ එකවර ගෙවනු ලබන මුදලක් ලෙස ලැබීමට හිමිකම් ලබන යම් දායකයකු විසින්, තම සේවායෝජක සමිතිය හෝ සංගමය හෝ සමග නිත්‍යානුකූල ගිවිසුමක් මත ගිවිසගත් යම් මුදලක් එකී සමිතියට හෝ සංගමයට ගෙවීමට ඇති අවස්ථාවකදී සමිතිය හෝ සංගමය විසින් දායකයාගේ එකඟත්වය සමග අධ්‍යක්ෂවරයාට කරන ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව, එසේ ගිවිසගත් මුළු මුදල හෝ ඉන්කොටසක් පියවීම සඳහා දායකයාගේ ගොනු මුදල / ශුද්ධ දායක මුදල සම්පූර්ණ හෝ ඉන් කොටසක් හෝ ඉල්ලීම කරනු ලබන සමිතියට හෝ සංගමයට හෝ උපදේශක කමිටුවේ එකඟත්වය මත ගෙවිය යුතු ය.

ගොනු මුදලෙන් හෝ ශුද්ධ දායක මුදලෙන් ගිවිසුම්ගත මුදල් පියවීම

23. මෙම නියෝග මාලාවේ දක්වා ඇති ආකාරයන්ට හැර, යම් කිසි දායකයෙකු සම්බන්ධයෙන් විශ්‍රාම වැටුප / දීමනා / පාරිතෝෂිකය ගෙවීම පිළිබඳව ගැටළුවක් මතුවූ අවස්ථාවකදී අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කමිටුවේ එකඟත්වය මත තීරණය කරනු ලබන ආකාරයට කටයුතු කළ යුතු ය.

ගැටළු පැන නගින අවස්ථාවක

24. සුදුසු සංකේතාංක ක්‍රමයක් භාවිත කරමින් ප්‍රඥප්තියේ 14.I වගන්තියේ සඳහන් අයුරු දායකයා වෙත නිකුත් කරන සහතිකයට අමතරව යෝජනා ක්‍රමයේ කටයුතු පරිපාලනය හා කළමනාකරණය විධිමත් කිරීමට පහත කරුණු සඳහා අත්‍යාවශ්‍ය තොරතුරු ඇතුලත් කරමින් ආකෘති පත්‍ර පිළියෙල කර භාවිතා කළ යුතු ය.

ආකෘති පත්‍ර

I. මනාපය පළ කිරීමේ ප්‍රකාශ පත්‍රය

II. යෝජනා ක්‍රමයට බැඳීමේ ඉල්ලුම් පත්‍රය

III. දායක මුදල් වැටුපෙන් අයකිරීම සඳහා බලය පැවරීමේ ලිපිය

IV. මාසික දායක මුදල් අවකරණ ලේඛණය

V. දඩමුදල් අයකිරීමේ දැන්වීම

VI. මරණ පාරිතෝෂිකය ලබා ගැනීමේ ඉල්ලුම් පත්‍රය

VII. ගොනු මුදල හෝ ශුද්ධ දායක මුදල ආපසු ගැනීමේ ඉල්ලුම් පත්‍රය

VIII. දායකත්වය ඒකාබද්ධ කිරීමේ ඉල්ලුම් පත්‍රය

IX. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට තව දුරටත් අවශ්‍යය යැයි හැඟෙන ආකෘති පත්‍ර

25. යම් කිසි දායකයකු සිය සේවා යෝජක සමිතිය හෝ සංගමය මගින් හෝ අයදුම් කොට වෙනත් සමුපකාර සමිතියක හෝ සංගමයක හෝ ස්ථිර සේවයට බැඳුණහොත් එසේ බැඳුන දින සිට දින 30 ක් ඇතුලත යෝජනා ක්‍රමයේ අධ්‍යක්ෂකවරයා වෙත ඒ බව දැනුම් දිය යුතු අතර අධ්‍යක්ෂකවරයා විසින් හඳුන්වා දී ඇති ආකෘතියට අනුව සිය දායක සහතිකය වලංගුව පවත්වාගෙන යාම සඳහා දායකත්වය ඒකාබද්ධ කිරීමට ඉල්ලුම් කල යුතු ය.

සාමාජිකත්වය ඒකාබද්ධ කිරීම

26. පිළිගත් ගිණුම් මූලධර්ම ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුකූලව ගිණුම් තැබීමට අධ්‍යක්ෂකවරයා වග බලාගත යුතු ය.

ගිණුම් තැබීම

වාර්සික වියදම් ඇස්තමේන්තු

27. I. අධ්‍යක්ෂකවරයා විසින් මෙම යෝජනා ක්‍රමයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතු ය.

II. වාර්ෂික ඇස්තමේන්තු ගත සීමාවන් ප්‍රමාණවත් නොවන අවස්ථාවලදී ඒ සඳහා පරිපූරක ඇස්තමේන්තු සකසා උපදේශක කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු ය.

ත්‍රෛයිමාසික වාර්තා

28. සෑම කාර්තුවක් අවසානයේදී ත්‍රෛමාසික ලැබීම් හා ගෙවීම් පිළිබඳව වාර්තාව පිළියෙල කළ යුතු අතර එම වාර්තාව කාර්තුව අවසාන වී දින 30ක් ඇතුලත උපදේශක කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

පහසුකම් හා සේවා

29. යෝජනා ක්‍රමය ක්‍රියාවේ යෙදවීමට අවශ්‍ය වන පහසුකම් හා සේවා ලබා ගැනීමේදී පළාත් මූල්‍ය රෙගුලාසි හා ප්‍රසම්පාදන කමිටු සීමා අනුව කටයුතු කිරීමටත් දෙපාර්තමේන්තු ප්‍රධානියා සතු සීමාව ඉක්මවා යන අවස්ථා වලදී උපදේශක කමිටු අනුමැතිය ලබා ගැනීමටත් කටයුතු කළ යුතුය.

කාර්යය මණ්ඩලය

30. ප්‍රඥප්තියේ 3.V වගන්තියේ දැක්වෙන ආකාරයට යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කාර්යය මණ්ඩලය සබරගමුව සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ තත්කාලයේ සේවයේ යෙදී සිටින නිලධාරින්ගෙන් යොදවා ගතයුතු අතර එසේ යොදවා ගැනීමට අවශ්‍ය ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයක් සඳහා සමුපකාර කොමසාරිස් හා රෙජිස්ට්‍රාර්ගේ එකඟත්වය හා උපදේශක කමිටුවේ නිර්දේශය සහිතව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂකවරයා කටයුතු කළ යුතු ය.

රාජකාරි පැවරීම

31. අධ්‍යක්ෂකවරයා විසින් යෝජනා ක්‍රමයේ කාර්යය මණ්ඩලය සඳහා රාජකාරි කොටස් පැවරීම මෙන්ම සුදුසු පරිදි බලය පැවරීම ද කළ යුතු ය.

අනනුකූලතාවය බලපැවැත්වීම

32. මෙම රෙගුලාසි වල සිංහල, දෙමළ, සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

(අ) උපලේඛනය

සබරගමුව පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය

වගුව අංක 01 -

වයස අවුරුදු 18 - 55 ත් අතර වයසකදී යෝජනා ක්‍රමයට බැඳෙන සේවකයින් ගෙවිය යුතු වාරික මුදල් හා හිමිවන විශ්‍රාම වැටුප්

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය	IV වැනි තීරය
යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ උපන් දිනයට වයස අවුරුදු	*ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*	*ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව*	*වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*
19	5	504	80
20	5	492	79
21	5	480	78
22	5	468	77
23	5	456	76
24	5	444	75
25	5	432	74
26	5	420	73
27	5	408	72

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය	IV වැනි තීරය
යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊළඟ උපන් දිනයට වයස අවුරුදු	*ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*	*ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව*	*වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණව*
28	5	396	71
29	5	384	70
30	5	372	69
31	5	360	68
32	5	348	67
33	5	336	66
34	5	324	65
35	5	312	64
36	5	300	63
37	5	288	62
38	5	276	61
39	5	264	60
40	5	252	59
41	5	240	58
42	5	228	57
43	5	216	56
44	5	204	55
45	5	192	54
46	5	180	53
47	5	168	52
48	5	156	51
49	5	144	50
50	5	132	49
51	5	120	48
52	5	108	47
53	5	96	46
54	5	84	45
55	5	72	44

වගුව අංක 02 -

වයස අවුරුදු 55 - 60 ත් අතර වයසකදී යෝජනා ක්‍රමයට බැඳෙන සේවකයින් ගෙවිය යුතු මුදල් හා හිමිවන විශ්‍රාම වැටුප්

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය	IV වැනි තීරය	V වැනි තීරය
යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේදී ඊලඟ උපන් දිනයට වයස අවුරුදු	*ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*	*ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව*	*වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේදී ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප විශ්‍රාම යන මාසයේ ලැබූ ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය*	*විශ්‍රාම වැටුප හිමිවන අවස්ථාව*
56 සිට 59	5	60	40	වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය හෝ අවම දායක මුදල් වාරික 60 ගෙවා නිමකල දිනය යන දෙකෙන් පසුව එළඹෙන දින සිට
60	5	60	40	අවම දායක මුදල් වාරික 60 ගෙවා නිමකල දින සිට එක් අවුරුදු කාලයක් සම්පූර්ණ වූ දින සිට

(ආ) උපලේඛනය

මරණයක දී ගෙවන මරණ පාරිතෝෂිකය

I වැනි තීරය	II වැනි තීරය
යෝජනා ක්‍රමයට බැඳුන දින සිට සේවා කාලය	*හිමිවන මරණ පාරිතෝෂිකය රුපියල්*
අවුරුදු 0 ට වැඩි - 5 නොවැඩි	10,000.00
අවුරුදු 5 ට වැඩි - 10 නොවැඩි	15,000.00
අවුරුදු 10 ට වැඩි - 15 නොවැඩි	20,000.00
අවුරුදු 15 ට වැඩි - 20 නොවැඩි	25,000.00
අවුරුදු 20 ට වැඩි - 25 නොවැඩි	30,000.00
අවුරුදු 25 ට වැඩි - 30 නොවැඩි	35,000.00
අවුරුදු 30 ට වැඩි	40,000.00

12 - 463

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.